39835

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම/විභාග අංකය :- ........................................................................ කාලය : පැය 01 යි.

සැළකිය යුතුයි.

- **සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **අංක 01 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**
- **1 පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.**

01. පාලි භාෂාවෙන් ලියන ලද මහා වංශයේ මුල් කොටසේ අර්ථ විවරණය සඳහා සම්පාදිත ටීකාව හඳුන්වන්නේ,
(i) සීහලට්ඨ කථා (ii) විනයට්ඨ කථා (iii) වංසත්ථප්පකාසිනි (iv) නිකාය සංග්‍රහය

02. දීප වංශය සම්බන්ධයෙන් පහත කරුණු අතරින් නිවැරදි කරුණ කුමක් ද?
(i) ක්‍රි. ව. 5 වන සියවසේ පමණ රචිතය.
(ii) ඓතිහාසික සිදුවීම් සියල්ල විස්තරාත්මකව දක්වා ඇත.
(iii) මහා වංශයේ අඩුපාඩු මග හරවා ගැනීමට රචනා කර ඇත.
(iv) මහසෙන් රාජ්‍ය සමයේ සිට මෙරට ඓතිහාසික තොරතුරු ඇතුළත්ය.

03. පහත ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
(i) ප්‍රාග් ඓතිහාසික යුගයේ දෙවන අවධියේ ලෝහ භාවිතය හා ස්ථිරවාසි ජනාවාස ආරම්භ විය.
(ii) ගල් යුගය පිළිබඳ සාක්ෂි රත්නපුර හා අවට මැණික් පතල්වලින් සොයා ගෙන ඇත.
(iii) ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද්දේ හොමෝ ඉරෙක්ටස් මානවයාය.
(iv) පහත රට තෙත් කලාපයේ විසූ මානවයා ආහාර ලෙස ගොඩබිම බෙල්ලන් යොදා ගත්හ.

04. පරුමකවරුන්ට කිසියම් ආකාරයක දේශපාලන බලයක් තිබූ බව සඳහන් සෙල්ලිපිය වන්නේ,
(i) කොත්ගල්කන්ද සෙල්ලිපිය (ii) සොරබොරවැව සෙල්ලිපිය
(iii) සිතුල්පව්ව සෙල්ලිපිය (iv) පෙරිමියන්කුලම සෙල්ලිපිය

05. අතීතයේ දී විවිධ වෘත්තිකයන් විසූ ගම් හැඳින්වීම සඳහා භාවිතා කළ නම් 'අ' තීරුවේ ද, එහි විසූ වෘත්තිකයන් 'ආ' තීරුවේ ද දක්වා ඇත. එම තීරු නිවැරදිව ගලපූ විට සුදුසු පිළිතුර තෝරන්න.

| | 'අ' | | 'ආ' |
|---|---|---|---|
| 1. | කසීකාරගාම | A | වළං තැනූ අය විසූ ගම් |
| 2. | කුම්භකාරගාම | B | ධීවරයන් විසූ ගම් |
| 3. | මණිකාරගාම | C | ගොවීන් විසූ ගම් |
| 4. | කේවට්ටගාම | D | රෙදි වියන්නන් විසූ ගම් |
| | | E | මැණික් ගැරූ අය විසූ ගම් |

(i) CADE (ii) CAEB (iii) ACDB (iv) ABDE

06. දැදුරු ඔය හරස් කර තනා ඇති ''රිදී බැඳි ඇළ'' මගින් ජලය සපයා ගත්තේ,
(i) මාගල්ල වැවට ය. (ii) හුරුළු වැවට ය. (iii) මින්නේරිය වැවට ය. (iv) තිසා වැවට ය.

07. අපේ පැරණි මුතුන්මිත්තන් උද්‍යාන නිර්මාණයේ දී පරිසරය සුරැකෙන අයුරින් කටයුතු කර ඇති බවට හොඳම නිදසුන වන්නේ
(i) මහමෙවුනා උයන නිර්මාණය කිරීම. (ii) සීගිරි ජල උද්‍යානය නිර්මාණය කිරීම.
(iii) ජේතවන උද්‍යානය නිර්මාණය කිරීම. (iv) රන්මසු උයන නිර්මාණය කිරීම.

08. යෝධ ඇළ හෙවත් ජය ගඟ විශිෂ්ට වාරි නිර්මාණයක් ලෙස සැලකෙන්නේ,
(i) කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන ගිය නිසා ය.
(ii) වැව් විශාල සංඛ්‍යාවක් පෝෂණය කළ නිසාය.
(iii) දිගු දුරකට ජලය ගෙන ගිය නිසාය.
(iv) භූමියේ සියුම් බෑස්ම උපයෝගී කර ගෙන නිර්මාණය කර ඇති නිසාය.

09. පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් සිදු වූ කාල අනුපිළිවෙළ අනුව දැක් වූ විට නිවැරදි පිළිතුර දැක්වෙන්නේ කුමන අක්ෂර කාණ්ඩයේ ද?
A සීගිරි බලකොටුව ගොඩ නැගීම
B ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
C කාලිංග මාඝ පොලොන්නරුව ආක්‍රමණය කිරීම
D ජය ශ්‍රී මා බෝධීන් වහන්සේ රෝපණය කිරීම
E අභය වැව ඉදි කිරීම

(i) EBADC (ii) DABCE (iii) EDBAC (iv) DBACE

10. ''පටුන්ගම්'' යනුවෙන් හැඳින්වෙන්නේ,

(i) වෙළඳ නගර ආශ්‍රිත ජනාවාස (ii) ආගමික ස්ථාන ආශ්‍රිත ජනාවාස
(iii) ගංගා මුවදොර ආශ්‍රිත තොටුපොළ ජනාවාස (iv) විවිධ කර්මාන්ත සඳහා ප්‍රසිද්ධ වූ ජනාවාස

11. I විජයබාහු රජතුමා පොළොන්නරුව යුගයේ ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකීමට ප්‍රධාන හේතුව වන්නේ,

(i) කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීමට කටයුතු කිරීම (ii) ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කරවීම
(iii) අසල්වැසි රාජ්‍ය සමග මිත්‍ර සබඳතා පැවැත්වීම (iv) චෝළ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම

12. නව රාජ පෙළපතක් ආරම්භ කරමින් මහනුවර රාජධානියට ශක්තිමත් පදනමක් දැමූ රජතුමා වන්නේ මෙතුමාය.

(i) සේනා සම්මත වික්‍රමබාහු රජතුමා (ii) I විමලධර්මසූරිය රජතුමා
(iii) II විමලධර්මසූරිය රජතුමා (iv) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

13. පළමු නාගරීකරණ සමයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණය මින් කුමක් ද?

(i) අසල්වැසි රටවල් සමග පමණක් වෙළඳාම් කිරීම
(ii) මුදල් පදනම් කරගෙන වෙළඳාම කිරීම
(iii) භාණ්ඩ අපනයන පමණක් සිදු කිරීම
(iv) පෙර අපර දෙදිග වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම

14. අතීතයේ දී ද යම් යම් දේ මැනීම සඳහා සුදුසු මිනුම් ක්‍රම භාවිතා කර ඇත. 'අ' තීරුවේ එවැනි මිනුම් ක්‍රම කිපයක් ද, 'ආ' තීරුවේ මිනුම් ඒකක ද දක්වා ඇත. එම තීරු දෙක සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | 'අ' | | 'ආ' |
|---|---|---|---|
| 1. | පැල | A | බර |
| 2. | ආංගුලය | B | කාලය |
| 3. | ගුන්ජා | C | අවකාශය |
| 4. | හවරජ | D | කෙටි දුර |

(i) CADB (ii) CDAB (iii) ACBD (iv) DACB

15. සබරගමුව පළාතේ 'කිරිමඩු යාගය' නම් ශාන්ති කර්මය යොදා ගෙන ඇත්තේ පහත දැක්වෙන කුමන කාර්යයක් සම්බන්ධයෙන් ද?

(i) ගොවිතැන් කටයුතුවල සාර්ථකත්වය හා ගවයන්ගේ ආරක්ෂාව සඳහා
(ii) අළුත් අස්වනු නෙලා ගැනීමෙන් පසු දෙවියන් පිදීම සඳහා
(iii) හේන් ගොවිතැන් කටයුතු වලදී අස්වනු සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා
(iv) දිගු නියං කාලයක් එළඹී විට වැසි ප්‍රාර්ථනා කිරීම සඳහා

16. කිසිදු සතකු නොමැරිය යුතු බවට මුල් වරට නීතියක් පැන වූ රජතුමා වන්නේ,

(i) iv මිහිඳු රජු (ii) නිශ්ශංකමල්ල රජු (iii) v මිහිඳු රජු (iv) අමණ්ඩ ගාමිණී අභය රජු

17. පැරණි පොත්වල ''යාගු'' හෙවත් ''හම්බු'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

(i) දුගී ජනයා ගත් ආහාර හැඳින්වීමට (ii) කැඳ යන වචනය වෙනුවට යෙදීමට
(iii) ධාන්‍ය බැඳ කුඩු කර තැනූ ආහාර හැඳින්වීමට (iv) රෝගීන් සඳහා දෙනු ලැබූ ආහාර හැඳින්වීමට

18. පහත 'අ' තීරුවේ සඳහන් සිදුවීම් හා 'ආ' තීරුවේ සඳහන් රජවරු එහි ඇති සම්බන්ධතාවය අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| | 'අ' | | 'ආ' |
|---|---|---|---|
| 1. | කාලිංග මාඝ පලවා හැරීම | A | VI පරාක්‍රමබාහු රජු |
| 2. | පන්සිය පනස් ජාතකය සිංහලට පෙරළීම | B | I පරාක්‍රමබාහු රජු |
| 3. | දැදිගම රාජධානියක් ලෙස පවත්වාගෙන යාම | C | iii පරාක්‍රමබාහු රජු |
| 4. | අවසන් වරට රට එක්සේසත් කිරීම | D | IV පරාක්‍රමබාහු රජු |
| | | E | II පරාක්‍රමබාහු රජු |

(i) EDBA (ii) BDAC (iii) CDEB (iv) AEDB

- 19 - 20 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රකාශ උදවු කර ගන්න.

A ගරිල්ලා සටන් ක්‍රමය මගින් විදේශිකයන් මර්ධනය කිරීම
B දැඩි මුස්ලිම් විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම
C මුහුදුබඩ ප්‍රදේශවල රෝමානු කතෝලික ආගම පැතිරවීම
D කුරුඳු වගාව ව්‍යාපාරික වශයෙන් ප්‍රචලිත කිරීම
E ඇළ මාර්ග ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගැනීම

19. ඉහත ප්‍රකාශ අතුරින් පෘතුගීසි පාලනය හා සම්බන්ධ ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?

(i) BD (ii) BC (iii) AD (iv) CE

20. ඉහත ප්‍රකාශ අතුරින් ලන්දේසි පාලනය හා සම්බන්ධ වන පිළිතුර කුමක්ද?

(i) CE (ii) BD (iii) DE (iv) AC

21. පහත 'අ' තීරුවේ පෘතුගීසීන් හා උඩරැටියන් අතර ඇති වූ සටන් කිහිපයක් හා 'ආ' තීරුවේ එම සටන් ඇති වූ වර්ෂ සඳහන් වේ. සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| 1. | දන්තුරේ සටන | A | 1602 |
| 2. | බලන සටන | B | 1638 |
| 3. | රන්දෙනිවල සටන | C | 1562 |
| 4. | ගන්නෝරුවේ සටන | D | 1594 |
| | | E | 1630 |

(i) DAEB (ii) DCEB (iii) ACDB (iv) AEBD

22. කාර්මික විප්ලවය මිනිසාට පාරිසරික වශයෙන් විශාල තර්ජනයක් ඇති වීමට ද බලපා ඇත. එයට හේතු වන්නේ,
(i) යුද්ධ සඳහා අවිආයුධ එක් රැස් කිරීමයි.
(ii) කාර්මික අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස පරිසරයට මුදා හැරීමයි.
(iii) තරුණ පරපුර මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වීමයි.
(iv) සමාජයේ පන්ති භේදය වර්ධනය වීමයි.

23. ක්‍රි. ව. 1453 යුරෝපා ඉතිහාසයේ වැදගත් වර්ෂයක් ලෙස සනිටුහන් වන්නේ කුමන කරුණක් නිසාද?
(i) බටහිර ජාතීන් ඉන්දියාවට පැමිණීම (ii) ඇමරිකා මහාද්වීපය සොයා ගැනීම
(iii) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අල්ලා ගැනීම (iv) ඇමරිගෝ වෙස්පුචි ඇමරිකාවට ගොඩ බැසීම

24. ලංකාවේ ලන්දේසීන් සතු මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසීන් අත්පත් කර ගන්නා විට ලංකාවේ සිටි ලන්දේසි ආණ්ඩුකාරවරයා කවුද?
(i) ස්පිල්බර්ජන් ය. (ii) ෆන්හුන්ස් ය. (iii) ලෝරන්ස් පිල් ය. (iv) ෆන් එංගල්බෙක් ය.

25. දේශගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමී රටවල් දෙක වන්නේ,
(i) එංගලන්තය හා ඕලන්දය (ii) ස්පාඤ්ඤය හා පෘතුගාලය
(iii) ප්‍රංශය හා එංගලන්තය (iv) එංගලන්තය හා පෘතුගාලය

26. උඩරට රාජ්‍යය අල්ලා ගැනීම සඳහා රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට තොරතුරු සපයමින් උදව් කළ ඉංග්‍රීසි ජාතිකයා වන්නේ
(i) ජෝන් ඩොයිලි (ii) මැක්ඩෝවල් (iii) ජේම්ස් සදර්ලන්ඩ් (iv) මේජර් ඩේවි

27. කෝට්ටේ රාජධානිය කොටස්වලට බෙදී යාමට තුඩු දුන් 'විජයබා කොල්ලය' සිදු වූයේ කුමන වර්ෂයේ ද?
(i) ක්‍රි. ව. 1518 (ii) ක්‍රි. ව. 1521 (iii) ක්‍රි. ව. 1543 (iv) ක්‍රි. ව. 1562

28. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම සම්බන්ධ පහත සිදුවීම්වල අනුපිළිවෙළ ඇතුළත් කුමන පිළිතුරේ ද?
A මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම.
B උඩරට රාජ්‍ය අත්පත් කර ගැනීම
C ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල තම බලය තහවුරු කර ගැනීම.
(i) CAB (ii) CBA (iii) BCA (iv) ABC

29. ඉංග්‍රීසි ජාතිකයන් ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට බලපෑ සාධක ඇතුළත් පිළිතුර කුමක් ද?
A නාවුක යාත්‍රා තද සුළඟින් ආරක්ෂා කර ගැනීමට හැකිවීම.
B ප්‍රංශ ජාතිකයන් සතු වැදගත් නාවුක මධ්‍යස්ථානයක් වීම.
C නැව් විශාල සංඛ්‍යාවක් නවතා තැබිය හැකිවීම.
D වරාය අවට කුරුඳු වගාව සාර්ථකව කරගෙන යාම
(i) AB (ii) BC (iii) AC (iv) CD

30. උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන් සතු කර ගැනීමට හේතු වූ ප්‍රධාන කරුණ කුමක් ද?
(i) නායක්කාර් වංශිකයන් උඩරට රාජ සභාවේ බලවත්ව සිටීම
(ii) වෙළඳ බෝග වැවීම සඳහා සුදුසු පරිසරයක් තිබීම
(iii) ආරක්ෂක වියදම් වැඩිවීම හා පාලනයට බාධා පැමිණීම
(iv) උඩරට අභ්‍යන්තර ප්‍රදේශවල ඇති වූ ගැටුම්වල දී ඉංග්‍රීසි සහාය පැතීම

31. 1848 දෙවන නිදහස් අරගලයට බලපෑ හේතු ඇතුළත් පිළිතුර කුමක් ද?
A අධික බදු පැනවීම
B භික්ෂූන් වහන්සේලා හා බුදු දහම නොසලකා හැරීම
C ගොවි ජනතාව නොසලකා හැරීම
D රදළයන්ට දී තිබූ බලතල ක්‍රමයෙන් ඉවත් කිරීම
(i) AD (ii) AB (iii) AC (iv) CD

32. පහත (1) හා (2) තීරුවල ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ඒවා ක්‍රියාත්මක වූ වර්ෂ දක්වා ඇත. ඒවා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| (1) | | | (2) |
|---|---|---|---|
| 1. | ඩොනමෝර් ප්‍රතිසංස්කරණ | A | 1910 |
| 2. | කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ | B | 1947 |
| 3. | සෝල්බරි ප්‍රතිසංස්කරණ | C | 1833 |
| 4. | මැනිං ප්‍රතිසංස්කරණ | D | 1920 |
| | | E | 1931 |

(i) EBDA (ii) EABD (iii) ACDB (iv) EBDC

33. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා ලෙස තේරී පත්වූයේ,
(i) පොන්නම්බලම් රාමනාදන් මහතා (ii) සර් ඩී. බී. ජයතිලක මහතා
(iii) පොන්නම්බලම් අරුණාචලම් මහතා (iv) ඩී. එස්. සේනානායක මහතා

34. බ්‍රිතාන්‍ය ජාතිකයන් ආරම්භ කළ වතු වගාව නිසා උඩරට ජනතාවට මුහුණ දීමට සිදු වූ ප්‍රබල ගැටලුවක් ලෙස සැලකිය හැකි වන්නේ මින් කුමක් ද?
(i) උඩරට සමාජ සිරිත් විරිත් විනාශ වී යාම
(ii) විදේශීය ව්‍යාපාරිකයන් ඉඩම් මිලදී ගැනීම
(iii) ඉන්දීය වතු කම්කරුවන් මෙහි පැමිණීම
(iv) මුඩුබිම් පනත් මගින් රජයට ඉඩම් පවරා ගැනීම නිසා ඉඩම් හිඟයක් ඇතිවීම

35. කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ සිදු වූවක් **නොවන්නේ,**
(i) උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම (ii) විධායක කාරක සභා පිහිටුවීම
(iii) ලංකාව පළාත් පහකට බෙදීම (iv) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම

36. කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස සොයා ගත් දුවන නඩාව, ජල රාමුව, මියුල් යන්ත්‍රය ආදිය කුමන කර්මාන්ත අංශයක් සඳහා යොදා ගත් නිෂ්පාදනයන් ද?
(i) ගල් අඟුරු කර්මාන්තය (ii) යකඩ හා වානේ කර්මාන්තය
(iii) පේෂ කර්මාන්තය (iv) ප්‍රවාහන අංශය

37. 1818 උඩරට නිදහස් අරගලය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වගන්තිය කුමක් ද?
(i) ඇහැලේපොළ අධිකාරම්, ගලගෙදර මොහොට්ටාල වැනි නායකයින් ඉංග්‍රීසින් අත්අඩංගුවට ගත්හ.
(ii) ඉංග්‍රීසින් ගේ පළමු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනාවල බලපෑම නිසා ඇතිවිය.
(iii) ඉංග්‍රීසි ආණ්ඩුව ගෙන ආ නව ඉඩම් ප්‍රතිපත්ති සාමාන්‍ය ජනතාව පීඩාවට පත් කළේය.
(iv) ඉංග්‍රීසින් හඳුන්වා දුන් නව බදු ප්‍රතිපත්තිය ජනතා විරෝධයට හේතුවක් විය.

- පහත AB හා C වලින් දැක්වෙන ප්‍රකාශ යුගල අධ්‍යයනය කර 38 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පුනරුදය
දේශගවේෂණය

C - ගෝලීයකරණය
සමාජ සම්බන්ධතා

B - කාර්මික විප්ලවය
පරිසර දූෂණය

D - විද්‍යාත්මක දියුණුව
නව සොයා ගැනීම්

38. පළමුවැන්න සිදුවීමෙන් පසු දෙවැන්න සිදු වූ අතර එය ලොව රටවල් අතර සම්බන්ධතාවල ස්වරූපය වෙනස් වීමටද බලපා ඇත.
(i) A (ii) B (iii) C (iv) D

39. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න වැඩි වී ඇති අතර ඒ තුළින් යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵලද උදා වී ඇත.
(i) A (ii) D (iii) C (iv) B

40. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න සිදු වූ අතර එම ප්‍රතිඵලවල අහිතකර හා හිතකර ප්‍රතිඵලයක් ලෙස ගත හැකි ප්‍රකාශ යුගල දෙක පිළිවෙළින් ඇතුළත් කුමන පිළිතුරේ ද?
(i) AB (ii) BC (iii) CD (iv) BD

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## ඉතිහාසය - II

නම/විභාග අංකය :- ....................................................................... කාලය : පැය 03 යි.

❖ I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
II කොටසේ ප්‍රශ්න හතරකට ද III කොටසේ එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.

❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.

(i) මහා වාලුකා නදිය, කලා ඔය, දඹකොළ පටුන, දේව නගර, අනුරාධපුරය, මහනුවර, හුරුළු වැව, ඉබ්බන්කටුව, මිහින්තලේ කන්ද, පරාක්‍රම සමුද්‍රය, මිහිපේ අමුණ, කාලතිත්ථ (ල. 12)

(ii) පෘතුගාලය, මලක්කා සමුද්‍ර සන්ධිය, මහා බ්‍රිතාන්‍ය, සුභ පැතිමේ තුඩුව, කොන්ස්තන්තිනෝපල්, පැනමා ඇළ (ල. 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියන්න.

A - මාතලේ අලු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවන ලද රජතුමා

B - දෙවන රාජසිංහ රජ සමයේ සිට උඩරට සිරකරුවකු ව සිට පසුව ශ්‍රී ලංකාව ගැන කෘතියක්ද රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා

C - දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරන සමයේ මෙරට පාලනය කළ රජතුමා

D - කෝට්ටේ යුගයේ දී යාපනය ප්‍රදේශයේ හින්දු කෝවිලක් ඉදිකිරීම සඳහා කටයුතු කළ කුමාරයා

(ල. 04)

(ii) A



(i) මෙම පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?
(ii) එය හමු වී ඇත්තේ කුමන ස්ථානයෙන් ද?
(iii) එම නිර්මාණය තුළින් පිළිඹිබු වන්නේ කුමන තාක්ෂණික අංශයක් ද?
(iv) මෙම නිර්මාණය අයත් වන්නේ කුමන ඓතිහාසික යුගයකට ද? (ලකුණු 04)

B



(i) මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
(ii) එතුමා ආරම්භ කළ බෞද්ධ සමාගම කුමක් ද?
(iii) මෙතුමා ලිපි සැපයූ පුවත්පතක් හෝ සඟරාවක නම ලියන්න.
(iv) ඉන්දියාවේ කුමන ආගමික සිද්ධස්ථානයක් බේරා ගැනීමට කටයුතු කළේ ද? (ලකුණු 04)

## II කොටස

02. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනකට නිදසුන් ලියන්න. (ලකුණු 03)

(ii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කර හඳුනා ගැනීමට පදනම් වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ''පූර්ව ඓතිහාසික යුගයේදී ද උසස් තාක්ෂණික දැනුමක් ප්‍රකට කර ඇත.'' නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් දක්වා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. (i) පහත A B C යනුවෙන් දක්වා ඇති රජවරුන් විසින් සිදු කළ වාරි නිර්මාණ මොනවාදැයි වරහන් තුළින් තෝරා A B C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - මහසෙන් රජතුමා B - ධාතුසේන රජතුමා C - II අග්බෝ රජතුමා

(ගිරිතලේ වැව, පදවිය වැව, මින්නේරිය වැව, කලා වැව, නාච්චදූව වැව) (ලකුණු 03)

(ii) පහත A B C D වලින් දක්වා ඇත්තේ වැවක කොටස්ය. ඒ එක් එක් කොටසින් ඉටු වන කාර්යය සඳහන් කරන්න.

A පිටවාන

B බිසෝකොටුව

C සොරොව්ව

D සළපතාව (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳාම දියුණු වී තිබූ බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ ද ශ්‍රී ලංකාවේ කර්මාන්ත ද ඉතා දියුණු තත්ත්වයක පැවැති බව නිදසුන් තුනක් මඟින් සනාථ කරන්න. (ලකුණු 06)

04. (i) රටේ නායකයා ලෙස මහ රජතුමාගෙන් ඉටුවිය යුතු යුතුකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත ABCD යටතේ දැක්වෙන සිදුවීම් හා සම්බන්ධ රජවරුන් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - සත් ද්‍රවිඩ ආක්‍රමණයකට මුහුණ දීම

B - අනුරාධපුරයේ අවසාන පාලකයා වීම

C - සියලු නගරාංග වලින් සමන්විත සැලසුම් සහගත නගරයක් නිර්මාණය කිරීම

D - ථූපාරාමය දාගැබ ඉදි කිරීම

(v වන මිහිඳු, vi වන මිහිඳු, වළගම්බා, I විජයබාහු, මහසෙන්, පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස)

(ලකුණු 04)

(iii) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට හේතු වූ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ''පළමු නාගරීකරණ අවධියට වඩා දෙවන නාගරීකරණ අවධියේ ආර්ථික රටාවේ වෙනස්කම් දක්නට ඇත.'' නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. (i) උඩරට රාජ්‍යයේ ''බද්දේ සංවිධානය'' ව්‍යුහයට අයත් නිදසුන් තුනක් පහත දැක්වේ. ඒවා කුමන කටයුතු හා සම්බන්ධ වේදැයි වරහන් තුළින් තෝරා ලියන්න.

A හැඳ බැද්ද

B කුරුවෙ බද්ද

C මඩිගෙ බද්ද

(ප්‍රවාහන කටයුතු, රෙදි වියීම, රෙදි සේදීම, වළං තැනීම, ඇතුන් ඇල්ලීම) (ලකුණු 03)

(ii) උඩරට රජතුමා විසින්ම විසඳන ලද නඩු වර්ග 4ක් දක්වන්න. (ලකුණු 04)

(iii) ''මහනුවර රාජධානි සමයේ පැවතියේ කෘෂිකාර්මික අර්ථ ක්‍රමයකි.'' කරුණු 3ක් ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 05)

(iv) I විමලධර්මසූරිය රජතුමා උඩරට සිය නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට අනුගමනය කළ පියවර 3ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) මිෂනාරිවරුන් ශ්‍රී ලංකාවේ තම ආගම පැතිර වීමේ දී යොදා ගත් මාධ්‍ය තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත දැක්වෙන සිදුවීම්වලට අදාළ පුද්ගලයින් A B C D අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A 1762 දී ප්‍රථමයෙන් උඩරටට පැමිණි ඉංග්‍රීසි ජාතිකයා

B සබරගමුව දිසාව භාරව සිට පසුව ඉංග්‍රීසීන්ට එකතු වූ අදිකාරම්වරයා

C මුල් වරට ශ්‍රී ලංකාවේ තේ වත්තක් ආරම්භ කළ පුද්ගලයා

D 1848 කැරැල්ලට ද හේතු වූ අධික බදු පැනවූ ආණ්ඩුකාරවරයා (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ කෝපි වගාව දියුණු වීමට බලපෑ හේතු 02ක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයේ යහපත් ප්‍රතිඵල හා අයහපත් ප්‍රතිඵල එක බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. (i) පහත A B C සිදුවීම් සම්බන්ධ භික්ෂූන් වහන්සේලා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A උඩරට ගිවිසුමට අත්සන් තබන අවස්ථාවේ ඉංග්‍රීසි කොඩිය බිම හෙළා සිංහ කොඩිය එස වූ භික්ෂූන් වහන්සේ

B මුල් වරට ශ්‍රී ලංකාවේ මුද්‍රණාලයක් ඇරඹීමට කටයුතු කළ භික්ෂූන් වහන්සේ

C පංච මහා වාද මෙහෙයවීම හා පැවැත්වීම සම්බන්ධ භික්ෂූන් වහන්සේ (ලකුණු 03)

(ii) a බෞද්ධ පුනරුද ව්‍යාපාරය යටතේ බිහිවූ බෞද්ධ පාසල් 2ක් ද

b හින්දු පුනරුද ව්‍යාපාරයේ පෙරමුණ ගත් නායකයෙක් හා

c ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයේ පෙරමුණ ගත් නායකයෙක්

a b c අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනාවල විශේෂ ලක්ෂණ 3ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

08. (i) පහත ලැයිස්තුවෙන් පුනරුද සමයේ බිහි වූ ගත් කතුවරු තිදෙනෙක් තෝරා ලියන්න. (ලකුණු 03)

(ඩාන්ටේ, පැරසල්සස්, බොකැෂියෝ, මයිකල් ආන්ජිලෝ, ප්‍රැන්සිස් බේකන්, විලියම් හාවේ)

(ii) පහත සිදුවීම් සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(අ) අප්‍රිකාවේ දකුණු තුඩුව බලා ප්‍රථම වරට පැමිණි පුද්ගලයා

(ආ) ඉන්දියාවේ කැලිකට් වරායට ප්‍රථමයෙන් පැමිණි පෘතුගීසි ජාතිකයා

(ඇ) බටහිර ඉන්දීය දූපත් සොයා ගත් යුරෝපා ජාතිකයා

(ඈ) ලෝ වටා යාත්‍රා කිරීමේ ගෞරවය හිමි කර ගත් පුද්ගලයා (ලකුණු 04)

(iii) ''15 වන සියවසේ අගභාගය වන විට නව මුහුදු මාර්ග සොයා ගැනීමේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා සුදුසු පරිසරයක් යුරෝපයේ නිර්මාණය වී තිබුණි.'' කරුණු 2ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ''පුනරුදයේ බලපෑම ශ්‍රී ලංකාව කෙරෙහි ද ගලා ආවේය.'' මෙරට ඇති වූ ආර්ථික වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

09. (i) බ්‍රිතාන්‍ය හැරුණු විට 18 වන සියවසේ කාර්මික විප්ලවය ව්‍යාප්ත වී තිබූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) කාර්මික විප්ලවය, කාර්මික හා තාක්ෂණික ක්ෂේත්‍ර ඔස්සේ පමණක් නොව වෙනත් අංශ කරා ද ව්‍යාප්ත විය. එසේ ව්‍යාප්ත වූ ක්ෂේත්‍ර 2ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) කාර්මික විප්ලවය දේශපාලන ක්ෂේත්‍රයේ ඇති කළ වෙනස්කම් දෙකක් දක්වා එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ''කාර්මික විප්ලවය සමාජ ක්ෂේත්‍රයේ ද බලපෑම් ඇති කළේය.'' එවැනි බලපෑම් 3ක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

01. (අ) (i)



01. (ඇ) (ii)

